# පුලතිසිපුර, මැදිරිගිරිය වටදාගෙය හා සෙසු පුරාවිද්‍යාත්මක ස්මාරක පිළිබඳ විමර්ෂණයක්.

සෙනරත්. කේ.කේ.ජී.කේ.එම්

## හැඳින්වීම

පොළොන්නරුව දිස්ත්‍රික්කය නැතහොත් පුලතිසිපුර යනු ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ වඩා වැදගත්වූත් විශේෂීවූත් සංධිස්ථානයක් වන බව කාටත් නොරහසකි. දිගු කාලීන ඉතිහාසයකට උරුමකම් කියනු ලබන මෙහි පෞරාණිකත්වය විදහා දැක්වෙන පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සාධක රාශියක්වන අතර එසේ වාර්තා වන්නා වූ සාධක අතුරින් පුරාවිද්‍යාත්මක උරුම ස්ථානවලට හිමිවනුයේ වඩා පිළිගැනීමකි. දිස්ත්‍රික්කය පුරාම ව්‍යාප්තව පවත්නා වූ මෙම පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක අතුරින් බහුතරය වර්තමානය වන විට මතුකොට හඳුනාගෙන වාර්තාකොට ඇති අතර එයිනුත් බොහෝමයක් ස්මාරක සංරක්ෂණයකොට මතු අනාගතයට ආරක්ෂාකොට ඇති බවත් හඳුනාගත හැක. ඉපැරණි පොළොන්නරු රාජකීය හා ආගමික මධ්‍යස්ථානය අයත් වන්නා වූ පොළොන්නරුව පැරණි නගරය ආශ්‍රිත මීට අයත් නටබුන් රාශියක් දැක හඳුනා ගැනීමේ අවස්ථාව උදා වේ. පැරණි බෞද්ධ හා හින්දු ආගමික නටඹුන්වලට සීමා නොවුන මෙහි පැරණි රාජකීය ගොඩනැගිලි ද අන්තර්ගතව පවතින අතර ඉන් බොහෝමයක් මේ වන විට සංරක්ෂණයකොට ඇත. පොළොන්නරු යුගයට අයත්යැයි ගැනෙන බොහෝමයක් පුරාවිද්‍යාත්මක ස්මාරකයන් පොළොන්නරු යුගය තුළම නිර්මාණය වූවත් නොවන අතර ඇතැම් ස්මාරක මානවයාගේ ආදිතම අවස්ථාවන්වන ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා අතීතයක් හිමි ඒවා බවත් හඳුනාගත හැක. ඒ අනුව දැනට ලෙන් විහාර බවට පත්ව ඇතැයි හඳුනා ගැනෙන බොහෝමයක් ස්මාරකවල සම්භවය එතරම් වූ ඈතකට දිවෙන බැව් හඳුනාගනී. ඒ අයුරින් හඳුනාගන්නා වූ පුරාවිද්‍යා ස්මාරකයන් ස්ථානයන් අතුරින් පුලතිසිපුර මැදිරිගිරිය වටදාගෙය හා ඒ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක ස්මාරකය තවත් විශේෂ වූ සාධකයක් වශයෙන් නම්කොට දැක්වීම වඩාත් නිවැරදි වනු ඇත.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සිංහල පත්තුවේ, මැදිරිගිරිය උප දිසාපති කොට්ඨාසයේ පිහිටියා වූ පුරාවිද්‍යා ස්මාරකයන් අතර වන්නා වූ මෙම ස්මාරකයට කොළඹ සිට මින්නේරිය හරහා දුර 209km ක් වශයෙන් වාර්තා වේ. මෙහි සිට උතුරට, බටහිරට, නැගෙනහිරට දිවෙන මායිම් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මායිම් ලෙසත් දකුණු මායිම මින්නේරිය උප දිසාපති කොට්ඨාසය ලෙසත් පිහිටා ඇති මෙහි වැදගත්කම හා පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ පවත්නා වූ වටිනාකම අවබෝධකොට ගනිමින් ඊට හිමිවිය යුතු ස්ථානය ලබා දීම 1937 වසරේ දී සිදුවිය. ඒ යටතේ 1937 වසරේ දී මෙම භූමිය පුරාවිද්‍යා රක්ෂිතයක් බවට පත්කිරීම සිදු කෙරුනු අතර එය එකල අති විශාල භූමි ප්‍රමාණයක් දක්වා ව්‍යාප්තව පැවතියක් බව විවිධ සාහිත්‍යය මූලාශ්‍රයන්ගේ මෙන්ම මෙම භූමිය ආශ්‍රිත පුද්ගලයින් සමඟ සිදු කළා වූ සාකච්ඡාවලින් ද අනාවරණය වේ. ඒ කෙසේ වුව ද අතීතයේ මීට අයත් ලෙස නම් කළා වූ භූමි ප්‍රමාණයෙන් බොහෝමයක් මේ වන විටත් ඊට අහිමිව ගොස් ඇත්තේ ඒ ආශ්‍රිතව සිදු වූවා වූ මානව ජනාවාස ඇති වීමත් සමඟය. මේ අයුරින් හඳුනාගන්නා වූ මැදිරිගිරිය වටදාගෙය හා ඒ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක ස්මාරකයන් පිළිබඳව සිදුකරන්නා වූ මෙම අධ්‍යයනයේ ප්‍රධානතම අධ්‍යයන අරමුණ වනුයේ මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව වර්තමාන තත්ත්වය නිවැරදිව හඳුනාගැනීම, ස්මාරක සංරක්ෂණය හා ඒ ආශ්‍රිත අගයන්

පවත්වාගෙන යාමට ගෙන ඇති ක්‍රියාමාර්ගයන් හා එහි අනාගත පැවැත්මට මේ වන විට එල්ල වී ඇති තර්ජනයන් මොනවාද යන්න හඳුනාගැනීම මෙන්ම අතුරු අරමුණු වශයෙන් පිහිටීම, පාරිසරික පසුබිම, ආගමික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම අනාවරණයකොට ගැනීම හා ඒ ආශ්‍රිත ඓතිහාසික තතු ඉදිරිපත් කිරීම වේ. මේ නිසාවෙන්ම පුරාවිද්‍යා ස්මාරක පිළිබඳව අධ්‍යයනය කිරීමට ඇල්මක් දක්වන අයවලුන්ගේ දැනුම් පිපාසයේ එක් අංගයක තතු දැක්වීමට මෙම ලිපිය මහගු දායකත්වයක් දක්වතැයි අපේක්ෂා කෙරේ.

**ක්‍රමවේදය.**

මැදිරිගිරිය වටදාගෙය හා ඒ ආශ්‍රිතව හඳුනාගන්නා වූ පුරාවිද්‍යා ස්මාරකයන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ දී වඩාත් වැදගත් වූ මූලාශ්‍රයන් රැසක් උපයෝගී විය. ඒ අතර ඓතිහාසික මෙන්ම පුරාවිද්‍යාත්මක වැදගත්කම් ද රාශියකින් සමන්විත වන්නා වූ අභිලේඛන මූලාශ්‍රයන් හඳුනාගත හැක. එලෙස මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව වාර්තා වන්නා වූ අභිලේඛන මූලාශ්‍රයන් බොහෝමයක් පිළිබඳව තොරතුරු Epigraphy & Zeylanica සහ Inscription Of Ceylon යන ග්‍රන්ථවල අන්තර්ගත වී ඇත. මෙහිදී අභිලේඛන මූලාශ්‍රයන් 9ක් පිළිබඳව දක්වා ඇති අතර එසේ මේ වන විට වාර්තාකොට ඇති අභිලේඛන අතර,

- බ්‍රාහ්මී අක්ෂර සහිත ගඩොල් - දේවානම්පියතිස්ස / උත්තිය රජු (ක්‍රි.පූ 3 - 2)
- වටදාගෙයින් හමු වූ රන්පත් ඉරු - හතරවන අග්ගබෝධි රජු (ක්‍රි.ව 7 සියවස)
- දමිළ සෙල්ලිපිය - දෙවන රාජේන්ද්‍ර චෝළ රජු (9වන සියවස)
- අංක 01 මැදිරිගිරිය ටැම් ලිපිය - හතරවන කාශ්‍යප රජු (ක්‍රි.ව 10වන සියවස)
- අංක 02 මැදිරිගිරිය ටැම් ලිපිය - පළවන රාජේන්ද්‍ර රජු (955 - 1016)
- අංක 01 මැදිරිගිරිය පුවරු ලිපිය - පළවන රාජේන්ද්‍ර රජු (1016 - 1044)
- අංක 02 මැදිරිගිරිය පුවරු ලිපිය - දෙවන රාජේන්ද්‍ර රජු (1052 - 1064)
- අංක 03 මැදිරිගිරිය පුවරු ලිපිය - දෙවන රාජේන්ද්‍ර රජු
- අංක 04 මැදිරිගිරිය පුවරු ලිපිය - දෙවන රාජේන්ද්‍ර රජු

යනාදී වශයෙන් හඳුනාගත හැකිය. මැදිරිගිරිය වටදාගෙය හා ඒ ආශ්‍රිත අනෙකුත් පුරාවිද්‍යා වැදගත්කමකින් යුක්ත වන්නා වූ ස්මාරකයන් පිළිබඳව තොරතුරු බොහෝමයක් මේ ආශ්‍රිතව වාර්තා වී පැවතීම තුළින් මෙහි ඓතිහාසික වැදගත්කම් රැසක් අනාවරණය කරගැනීමේ හැකියාව පවතී. මෙහි දී දැනට වාර්තා වී ඇති අභිලේඛන මූලාශ්‍රයයන් අයත් වන්නා වූ කාලවකවානු පිළිබඳව අවධානය යොමු කරමු. ඒ තුළ මෙම ස්මාරක ක්ෂේත්‍රය එක් කාලයකට පමණක් සීමා වූවක් නොවන බව හඳුනාගත හැකි අතර ක්‍රි.පූ 2-3 සියවස්වල පටන් ක්‍රි.ව 1064 - දෙවන රාජේන්ද්‍ර රජ සමය ආදී වශයෙන් දීර්ඝ කාලයක් පුරා ව්‍යාප්ත වූ ලේඛන මූලාශ්‍රය මඟින් ප්‍රාදේශීය තොරතුරු මෙන්ම සමකාලීන රට තුළ පැවති සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික තතු රැසක් අනාවරණය කරගැනීමට අවස්ථාව උදා කොට දේ.

මෙම අධ්‍යයනයට අවශ්‍ය තතු එක්රැස් කිරීමේ දී වාර්තා වී ඇති අභිලේඛන මූලාශ්‍රයයන්වලට අමතරව සාහිත්‍යය මූලාශ්‍රයයන් බොහෝමයක් අධ්‍යයනය කිරීම තුළින් ද මේ පිළිබඳව කරුණු අනාවරණයකොට ගත හැකි විය. මේ ආශ්‍රිත ඇතැම් ඓතිහාසික වැදගත්කම් සහිත තොරතුරු ප්‍රාදේශීය ව්‍යවහාරයන් තුළින් ද අනාවරණයකොට ගත හැක. පරම්පරාගතව පැවතෙන්නා වූ දැනුමින් යුක්ත ඇතැම් පුද්ගලයන් සමඟ සිදුකරනු

ලබන සාකච්ඡාවන්ගෙන් ද මෙහි ඓතිහාසික පසුබිම පිළිබඳව ඇතැම් කරුණු අනාවරණයකොට ගත හැකි අතර සාහිත්‍යයමය මූලාශ්‍රයන්ගෙන් වාර්තා වන්නා වූ තොරතුරු හා මෙම තතු සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමේදී එහි සත්‍යාසත්‍යතාවන් ද නිවැරදිව හඳුනාගත හැකිය.

## ප්‍රතිඵල

අධ්‍යයනය ඔස්සේ මැදිරිගිරිය වටදාගෙය හා ඒ ආශ්‍රිත සෙසු පුරාවිද්‍යාත්මක ස්මාරකයන් පිළිබඳව දත් නොදත් තතු රාශියක් අනාවරණය කරගැනීමට අවස්ථාව උදා වූ බව පිළිගත යුතුම කරුණක් වන අතර මෙම සාකච්ඡාව තුළින් එම තතු දැක්වීමට අපේක්ෂා කරමු.

## සාකච්ඡාව

මැදිරිගිරිය පුරාවිද්‍යාත්මක ස්මාරකයේ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික පසුබිම පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී බොහෝමයක් තොරතුරු අනාවරණය කොට ගත් බව ඉහතින් සඳහන් කරන ලදි. එසේ වාර්තා කොටගත් තතු මෙසේ ගෙනහැර දක්වමු. පුලතිසි පුරවරයෙන් වාර්තා වී ඇති පුරාවිද්‍යා ස්මාරකයන් අතුරින් මැදිරිගිරිය ස්මාරකයන්වලට වඩා වැදගත්කමක් හිමිවනුයේ එහි පවත්නා වූ ඓතිහාසික වැදගත්කම නිසාවෙන්මය. මෙවන් වැදගත්කමක් හිමිකරගන්නා වූ මෙම ක්ෂේත්‍රයේ උත්පත්ති අවස්ථාව පිළිබඳව දැන හඳුනාගැනීමේ දී අධ්‍යයනයට බඳුන්කරනු ලබන ඓතිහාසික ලේඛන ඔස්සේ වඩා පැහැදිලි සාධකයන් අනාවරණයකොට ගැනීමට නොහැකි වුවද දැනට වාර්තා වී පවතින සාධක පදනම් කරගනිමින් ඉතිහාසඥයින් හා පුරාවිද්‍යාඥයින් පෙන්වාදෙන්නේ මෙහි කාලවකවානුව ක්‍රිස්තු පූර්ව යුගවල සිට දහතුන්වන සියවස පමණ දක්වා වූ කාල පරාසයක් දක්වා විහිදී පවතින බවයි. මොවුන් විසින් මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රය වෙත මෙවන් කාල නීර්ණයක් ලබාදීම උදෙසා පාදක කොටගත් සාධකයන් අතර සාහිත්‍යයමය වන ඓතිහාසික ලේඛනවලට අමතර වූ ප්‍රබල සාධකයක් ලෙස පුරාවිද්‍යාත්මක සාධකයන් ද වන බව හඳුනාගැනීම ඉතාම වැදගත් වේ. මැදිරිගිරිය පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ එතෙක් මෙතෙක් කාලය පුරාවට පුරාවිද්‍යාත්මක ගවේෂණ, පර්යේෂණ මෙන්ම කැනීම් ඔස්සේ අනාවරණයකොට ගෙන ඇති සාධක බොහෝමයක් පිළිබඳව අධ්‍යයනය තුළ දී කරුණු අනාවරණයකොට ගැනීමට අවස්ථාව උදා වේ. විශේෂයෙන්ම මෙහි දී වාර්තා කොටගෙන ඇති සාධක ඔස්සේ මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳව කරුණු බොහෝමයක් දැක්විය හැකිවන අතර එසේ දැක්වෙන කරුණු අතර අදාල ක්ෂේත්‍රයට කාලනීර්ණයන් ඉදිරිපත් කිරීමට උපකාර වන සාධක වශයෙන් පුරාවිද්‍යා කැනීම් ඔස්සේ වාර්තා වී ඇති සාධකවලට උදාහරණයන් වශයෙන් මැදිරිගිරිය වටදාගෙය ආශ්‍රිත කුඩා ස්තූපයෙන් වාර්තාවන ගඩොල්වල සඳහන්වන පෙදරේරු සලකුණු දැක්විය හැකිය. මෙසේ වාර්තා වන්නා වූ පෙදරේරු සලකුණු පිළිබඳව විමර්ෂණාත්මකව බැලීමේ දී එහි සඳහන්කොට ඇත්තේ පැරණි බ්‍රාහ්මී අක්ෂර වන බව හඳුනාගන්නා පුරාවිද්‍යාඥයින් විසින් ඒ ඔස්සේ මෙම භූමිය තුළ ක්‍රිස්තු පූර්ව අවධියේ පටන්ම බෞද්ධාගමික ආරාම සංකීර්ණයක් පවතින්නට ඇතැයි අදහස් කොට ඇත. විශේෂයෙන්ම ගඩොලින් ඉදිකරන ලද ස්තූපයක් යනු බෞද්ධාගමික ගොඩනැගිලි සම්ප්‍රදායේ ඉතාමත් දියුණු ගොඩනැගිලි විශේෂයක් වන හෙයින් මෙම ගඩොල් නිර්මාණවලට පෙර පටන්ම මෙහි යම් යම් ආගමික හෝ ආගමික නොවන ඉදිකිරීම් හෝ සාධක පැවතිය හැකි යැයි ඇතමෙකුට අනුමාන කිරීමේ හැකියාව ද පවතින අතර එහි ද වරදක් නොවනුයේ ඕනෑම සාධකයක පරිණාමීය අවස්ථා කිහිපයක් පැවතීම ස්වභාවික කරුණක් වන නිසාවෙන්මය.

ඉහතින් දක්වන ලද පරිදි මෙම අධ්‍යයනය තුළ දී ප්‍රාදේශීය ජනතාව අතර පවතින්නා වූ ජනප්‍රවාදයන් අතුරින් එකක් ලෙස මෙම විහාරාරාම සංකීර්ණය ඉදිකිරීම මහසෙන් රජුගේ සොයුරියකවන බිසෝ බණ්ඩාර දේවිය විසින් සිදු කරන ලද්දකැයි ද මතයක් වේ.(ක්‍රි.ව 266 - 303) මහසෙන් රජු විසින් කරවා ඇති කවුඩුලු වැව හෙවත් තිස්සඩඪ්ඪමානක වැව ද මෙම මැදිරිගිරිය ආරාමයට ඉතාම නුදුරින් පිහිටා ඇත්තක් වන අතර මෙහි දී මැදිරිගිරිය ආරාම සංකීර්ණය ආශ්‍රිතව පුරාවිද්‍යාත්මක ඉදිකිරීම්වල නිර්මාණ කාර්යයන් කලින් කල විවිධ පුද්ගලයන්ගේ අනුදැනුම මත සිදුකොට ඇති බවත් හඳුනාගනී. ඒ අනුව මෙහි ''මණ්ඩලගිරිත'' හෙවත් මැදිරිගිරිය විහාර පරිශ්‍රයෙහි භාතිකතිස්ස රජුගේ සහෝදරයෙකු වූ කණිට්ඨතිස්ස රජුගේ කාල වකවානුවේ දී ඉදිකරන ලද උපෝසථාගාරයක නෂ්ඨාවශේෂ දැකගත හැකිය. බොහෝ කාලයක් මුලුල්ලේ වනගතව පැවතියා වූ මැදිරිගිරිය පුරාවිද්‍යා ස්මාරක භූමිය මේ අයුරින් අප්‍රකටව වනගතව දීර්ඝ කාලයක් පුරාවට සැඟව පැවතීමට ප්‍රධානතම හෙතු සාධකයක් වූයේ එකල සිදු වූ අනුරාධපුර හා පොළොන්නරු යුගවල බිඳ වැටීම් සමඟ මෙරට රාජධානි ප්‍රධාන මධ්‍යස්ථානයන් රට තුළ නිරිත දිගට විතැන් වීම බව කාටත් නොරහසකි. රාජධානි විතැන් වීමත් සමඟ සිදු වූවා වූ ජන සංක්‍රමණයන් සමඟ මෙම ආරාම ගරා වැටීම ආරම්භ වූ බව පැහැදිලිය. මෙසේ ජන ශූන්‍යව වනගතව පැවති බොහෝමයක් පුරාවිද්‍යා ක්ෂේත්‍රයන් අනාවරණය කරලීම මෙරට ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ එච්.සී.පී බෙල් මහතා යටතේ සිදුකෙරීය. මැදිරිගිරිය පුරාවිද්‍යා භූමිය වාර්තාගත කිරීම ද මෙහි ප්‍රතිඵලයක් විය. ඉන් අනතුරුව 1942 - 1945 අතර කාලය තුළ සමකාලීන මෙරට පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් මෙම ස්මාරක ක්ෂේත්‍රය හෙළි පෙහෙළි කිරීමට කටයුතු කොට ඇති අතර 1934 වර්ෂයේ දී ලිපියේ මුලින් සඳහන් කළා වූ පරිදි මේ ස්ථානය පුරාවිද්‍යා කටයුතු වෙනුවෙන් මැනුම් කටයුතු සිදුකොට 1939දී පුරාවිද්‍යා භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇත.

මෙසේ හඳුනා ගන්නා මැදිරිගිරිය පුරාවිද්‍යා ස්මාරක ක්ෂේත්‍රයේ සුවිශේෂීම ඉදිකිරීම වනුයේ එහි පවත්නා වටදාගෙය යි. දැනට මෙහි දක්නට ලැබෙන ප්‍රධාන ස්මාරක අතුරින් එකක් වන මෙම ඉදි කිරීම හතරවන අග්‍රබෝධි රජ සමයේ මළයරාජ නම් වූ ධනවත් අයෙකු විසින් (ක්‍රි.ව 667 - 683) නිර්මාණය කරන ලද්දක් වෙතැයි මහාවංසයේ දක්වා ඇත. මෙම ප්‍රධාන ස්මාරකය ඉදි කිරීමට මත්තෙන් මෙහි කුඩා ප්‍රමාණයේ ස්තූපයක් පැවති බවට සාධක වාර්තා වීම හේතුවෙන් මෙම වටදාගෙය අදාල ස්තූපය අලලා ඊට අවශ්‍ය ධාතු ගෙයක් හෙවත් වටදාගෙයක් වශයෙන් ඉදිකරන්නට ඇති බව මේ පිළිබඳව අධ්‍යයනයන් සිදුකරන ලද පුරාවිද්‍යාඥයින්ගේ අදහසවන අතර ඓතිහාසික වශයෙන් මෙන්ම පුරාවිද්‍යාත්මක වශයෙනුත් මෙහි පවත්නා වැදගත්කම අවබෝධ කොටගත් සෙනරත් පරණවිතාන මහතා විසින් 1942 -1945 අතර කාල වකවානුවේ දී මෙහි සංරක්ෂණ කටයුතු සිදුකොට ඇත. විවිධ ප්‍රමාණයේ ගල් කැබලි භාවිත කරමින් උත්තර දිශාවෙන් මේ වෙත ඉදිකොට ඇති ප්‍රවේශයක්වන අතර එහි උසින් අඩි 9 අඟල් 9ක් හා පළල අඩි 9 අඟල් 9ක් වශයෙන් වන පියගැට පෙළක් ද වේ. මෙහි විශේෂත්වය නම් විවෘත බරාදයකින් හා පියගැට 27කින් යුක්ත සුවිසල් ඉතාම මනාව නිර්මාණය වූවක් වීමයි. මේ අයුරින් නිර්මාණය වන්නා වූ ප්‍රවේශය පාමුල හුණුගල් ආශ්‍රිතව නිර්මිත ඉතා අලංකාර සඳකඩපහණක් මෙන්ම කොරවක්ගලක් දැකගත හැකි අතර මෙම ස්ථානයට ප්‍රවේශ වන අයෙතුට ඔවුනගේ පහසුව තකා පඩිවල අතරමැදින් තැනිකලාවන් තැබීමට ද මෙහි නිර්මාණ ශිල්පීන් කටයුතු කොට ඇත. මෙම වටදාගෙය ස්වභාවිකවම පිහිටියා වූ ගල් පර්වථයක් මත ඉදිකොට

ඇති අතර ප්‍රධාන ප්‍රවේශයේ පාමුල පා දෝවනයක් පැවතියා වුව ද අදවන විට එය විනාශ වී ගොස් ඇති බව හඳුනාගත හැක. එමෙන්ම මේ ආශ්‍රිතව වහලක් සහිත කොටසක් පැවති බවට ද සාධක වේ. ඒ මේ ආශ්‍රිත ප්‍රවේශයේ සඳකඩපහණ ආශ්‍රිතව විශාල ශෛලමය උළුවස්සක් දක්නට ලැබීමයි. මෙම ගල් උළුවස්ස උසින් අඩි 9 අඟල් 9ක් හා පළලින් අඩි 4 අඟල් 9ක් වශයෙන් වාර්තා වේ. එහි ඉදිරිපස කොටස ඉතාමත් අලංකාර රුකම්වලින් සමන්විත වන අතර ඊට පසුපසින් සමාන්තරව ඉදිකරන ලද හතරැස් කණු දෙකක් ද පිහිටුවා ඇත. මේ අයුරින් නිර්මාණය කොට ඇති ප්‍රවේශයේ පියගැට පෙළෙහි අත් වැටක් බඳු පවුරක් ඉදිකොට ඇති බවත් එහි මුදුනේ අඩි 25ක බරාදයක් ඇති බවත් හඳුනාගත හැක.

මෙහි පඩිපෙළෙහි ඉහළ කොටස් දෙපසේ ශෛලමය පීඨිකා ද්විත්වයක් හඳුනාගත හැකි අතර මෙසේ ඉදිකොට ඇති පීඨිකා ද්විත්වය මත පුන්කලස් දෙකක් තැන්පත් කොට ඇත. ඉන් අනතුරුව පිවිසෙන්නේ මළුවටයි. මෙම මළුවෙහි ප්‍රවේශය සමගම සුවිශේෂී නිර්මාණයකි. එනම් මළුවට ඇතුල්වන විටම දක්නට ලැබෙන සතර දිශාවට මුහුණලා වැඩ හිඳිනු ලබන ධ්‍යාන ඉරියව්වෙන් යුතු බුද්ධ ප්‍රතිමා සතරකි. මළුව වටා ඉදිකොට ඇති ශෛලමය ප්‍රාකාරයත් ගල් කණු ද්විත්වය අතර අඩි 3 අඟල් 6ක් දිගින් හා පළලින් යුතුවන ''බෞද්ධ ගරාදි වැට'' ලෙස නම්කොට ඇති රුකම් නිර්මාණයකින් ද මෙය සමන්විත වේ. මැදිරිගිරිය වටදාගෙය තුළින් වාර්තා වන්නා වූ මෙම ගරාදි වැටට සමාන නිර්මාණයන් අනුරාධපුරෙන් මෙන්ම ඉන්දියාවේ සාංචි ස්තූපය ආශ්‍රිතව දැකගත හැක. මෙසේ හඳුනාගන්නා මෙහි වෘත්තාකාර කොටසේ විෂ්කම්භය අඩි 91ක් පමණ වන අතර ස්වභාවිකව පිහිටියා වූ ගල් තලාවේ දකුණු පැත්තේ පටන් විහිදී එන ගඩොලින් නිම වී ඇති ආධාරක බැම්ම අඩි 14ක් පමණවන උසකින් යුක්ත වේ. එහිම ගල් තලාවේ බෑවුම පැත්තේ වටදාගෙය ආරම්භවන කොටසේ උස අඩි 17ක් ලෙසත් සිදුකරන ලද පුරාවිද්‍යා කැනීම් ඔස්සේ වාර්තා කොටගෙන ඇති අතර මෙම කොටස් පසුකාලීනව දළ ගල් කුට්ටි භාවිත කරමින් සංරක්ෂණයකොට ඇත. වටදාගෙහි ඉතිරි කොටස අඩි 13ක පමණ උසකින් යුතුවන අතර එහි ගලින් තනා ඇති වටකුරු කොටසේ ගලින්ම තනා ඇති විවෘත බරාදයකි. ගල් පුවරු භාවිත කරමින් පැති මුහුණත නිර්මාණයකොට ඇති මෙහි පොළොව ද ගල් පුවරු අතුරා නිර්මිත බැව් හඳුනාගත හැක. පියගැටපෙළ සතරකින් බරාදයේ සිට වටදාගෙයට ප්‍රවේශවීමට හැකි වේ. මෙම ප්‍රවේශයේ අනෙක් ප්‍රවේශයන්ගේ මෙන්ම නිර්මාණය වූ පියගැටපෙළ දෙපස වන පීඨිකා ද්විත්වයක්, ඒ මත තැබූ පුන්කලස් දෙකක් ආදී වශයෙන් දැකගත හැක. මෙහි උළුවහු ශෛලමය නිර්මාණයන් පමණක් වන අතර විශේෂත්වය නම් ඒ සියල්ල බොරදම් කපා නිර්මාණයකොට තිබීමයි. ඒ ආශ්‍රිත සඳකඩපහණ ද රුකම්වලින් තොර වූ චාම් ඒවා වන අතර මැදිරිගිරිය වටදාගෙහි කුළුණු පාදයන් යට තිබී අඟල් 3ක් දිගින් යුතු වන රන්පත් ඉරුවක් වාර්තා වේ. එහි ''ඉතිපිසෝ භගවා'' යනුවෙන් සටහන් කොට ඇති අතර මේ සියලු වැදගත්කම් නිසාවෙන්ම ශ්‍රී ලංකාවේ වටදාගෙවල් අතුරින් මැදිරිගිරිය වටදාගෙය විශේෂී වූවක් වශයෙන් හැඳින්වීම වඩාත් නිවැරදි වනු ඇත.

මැදිරිගිරිය වටදාගෙය ආශ්‍රිතව පවත්නා වූ ප්‍රධාන ස්මාරකයන් අතර එම පරිශ්‍රයේ ඇති ප්‍රතිමා ගෘහයන් ද විශේෂී ස්ථානයක් ගනී. එසේ මෙම පරිශ්‍රය ආශ්‍රිතව හඳුනාගන්නා ප්‍රතිමා ගෘහයන් ප්‍රධාන වශයෙන් හිටි පිළිම ගෙය, සැතපෙන පිළිම ගෙය හා තවත් පිළිම ගෙවල් දෙකක් පිළිබඳව සාධක වාර්තා වී ඇත. හිටි පිළිමගෙය වටදාගෙයට වයඹ දිශාවෙන් ද සැතපෙන පිළිමගෙය හිටි පිළිමගෙයට ගිණිකොණ දිශාවෙන් ද අනෙකුත් පිළිම ගෙවල් දෙකක පිහිටීම් ද මෙහි වර්තමානය වන විටත් ඉතාමත් හොඳින් දැකගත හැක. මැදිරිගිරිය ආශ්‍රිත

වන්නා වූ ප්‍රධාන පුරාවිද්‍යා ඉදිකිරීම් ස්මාරක වශයෙන් මෙම ප්‍රතිමා ගෘහයන්ට අමතරව වටදාගෙය ඉදිරිපස මාලකය, වටදාගෙයට උතුරින් වූ උස් ගල් තලාව, ගල් තලාව මත වූ ස්තූපය, ඉපැරණි ආරෝග්‍ය ශාලාව යනාදිය හඳුනාගත හැක. වටදාගෙයට උතුරු දිශානුගතව පවතින ගල් තලාව මතින් පැරණි ස්තූපයක සාධක අනාවරණය වීම සමඟ එය සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර එහි විශ්කම්භය අඩි 45ක් ලෙසත් පේසා වළලු එකකින් පමණක් සමන්විතවන ලෙසත් නිර්මිතය. අනෙකුත් ස්තූපයන්ගෙන් තරමක් වෙනස් ස්වරූපයක් ගනු ලබන මෙහි පිවිසුම් පඩිපෙළ පාමුල හුණුගලින් නිර්මිත මුරගල් දෙකක් ද හඳුනාගත හැක. ස්තූපය මෙන්ම පැරණි රෝහල ද බෙහෙවින් විශ්ෂිත වේ. මෙම රෝහල් ගොඩනැගිල්ලෙහි බිම් සැලැස්මෙහි එකක් තුළ එකක් පිහිටි ලොකු හා කුඩා චතුරස්‍ර දෙකකින් යුතුය.

මීට අමතරව මෙම ක්ෂේත්‍රය තුළ පිහිටා ඇති අප්‍රධාන පුරාවිද්‍යාත්මක ස්මාරක හා පුරාවිද්‍යා අවශේෂ රැසක් ද හඳුනාගත හැකි අතර එසේ හඳුනාගන්නා ස්මාරකයන් අතර නැගෙනහිර දොරටුව, පොකුණු, ලෙන් විහාර, වැසිකිළි ගලක්, කැසිකිළි ගලක්, ප්‍රාකාරය, බෙහෙත් ඔරුව ආදිය හඳුනාගත හැක. මේ අතුරින් ලෙන් විහාරය සුවිශ්ෂී තැනක් ගනු ලබයි. මෙම ලෙන ප්‍රධාන ස්මාරකය වන වටදාගෙයට උතුරු දිශාවෙන් පිහිටි ගල් තලාවේ නැගෙනහිර කෙළවරේ දැකගත හැකි අතර එය අඩි 9ක් පමණවන දිගකින් යුක්තව ගල අභ්‍යන්තරයට දිවෙන ආකාරයෙන් නිර්මිත බැව් දකින අයෙකුට ප්‍රත්‍යක්ෂ වී යනු ඇත. මෙහි ද්වාරය අඩි 8 අඟල් 4ක් උසකින් යුක්තවන අතර සෙල්ලිපි හෝ ශිලා ලේඛන කිසිවක් මෙහි අන්තර්ගත නොවේ. මෙය භික්ෂූන්ගේ සංඝාවාසයක් වශයෙන් භාවිතා කරන ලද්දක් බව තහවුරු කොට ගන්නේ ද එයින් වාර්තාවන පාෂාණ හා ගඩොල් කැබලිවලින් අනාවරණය කරගත් වාස්තුවිද්‍යාත්මක අවශේෂ හා ලෙන් කටාරම මගිනි. වටදාගෙය ආශ්‍රිත අප්‍රකට පුරාවිද්‍යා ස්මාරක හා සාධක අතර තවත් සුවිශේෂී පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත සාධකයන් වශයෙන් මේ ආශ්‍රිත ප්‍රතිමා හා රූකම් නිර්මාණ පෙන්වාදිය හැක. එසේ වාර්තා වන ප්‍රතිමා ලෙස බුද්ධ ප්‍රතිමා හා බෝධිසත්ව ප්‍රතිමා දැකගත හැක. වර්තමානයවන විටත් හොඳින් ආරක්ෂා වී පවතින ප්‍රතිමා බොහෝමයක් දැකගත හැකිය. මැදිරිගිරිය විහාරාරාමය ආශ්‍රිතව හිඳි පිළිම, හිටි පිළිම මෙන්ම සැතපෙන පිළිම යන ආකාර තුනේම බුද්ධ ප්‍රතිමාවන් දක්නට ලැබේ. මේවා ප්‍රධාන වශයෙන් වටදාගෙය හා ප්‍රතිමා ගෘහයන්හි තැන්පත්කොට ඇති අතර වටදාගෙයි ස්තූපය සතර දිශාවන්හි පිහිටුවා තිබෙන ඒකාංශ පාරූපන ක්‍රමයට චීවරය පෙරවූ ධ්‍යානී හිඳි ඉරියව්වේ ඒවා වශයෙන් පුරාවිද්‍යාඥයින් හා ඉතිහාසඥයින් විසින් අදහස් කෙරේ. බෝධිසත්ව ප්‍රතිමා ගත් කළ ප්‍රතිමාවන් දෙකක් දැකගත හැක. මේවා හිරිගල් භාවිත නිර්මාණයන්වන අතර ස්වභාවික උපද්‍රවයන්ට නිරාවරණයවන නිසාවෙන්ම මෙම ප්‍රතිමා ස්වභාවයෙන්ම විනාශ වෙමින් පවතින බැව් හඳුනාගත හැක.

මේ ආශ්‍රිත රූකම් නිර්මාණ දෙස බැලීමේ දී කුළුණු රූකම්, ශ්‍රීපාද ලාංඡන රූකම් පුවරු, පුන්කලස්, පාදම් සැරසිලි, සඳකඩපහණ්, මුරගල්, කොරවක්ගල්, යන්ත්‍රගල් තුළ තැන්පත් කරන ලද ලෝහමය පුරාවස්තු ආදී වූ නිර්මාණ රාශියක් දැකගත හැක. මෙම නිර්මාණ බොහෝමයක් මේ ආශ්‍රිත වාස්තුවිද්‍යා නිර්මාණ තාක්ෂණය සමඟ ඉතාම සමීපව පවතින්නා වූ ලක්ෂණයන් නිරූපණය කරනු ලබන නිසාවෙන් ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වඩාත් වැදගත් කරුණක් වනු නියතය. මෙසේ ගත් කල මෙම විහාරයේ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ හා බැඳී පවතින්නා වූ චාම් රූකම් නිර්මාණ බහුල මෙහි වටදාගෙය ආශ්‍රිත කුළුණු ශීර්ෂයන්වලට වඩාත් වදගත්කමක් හිමි වේ. මෙම කුළුණු හිස්හි පවත්නා රූකම් දෙස

බැලීමේදී ඒවායේ හංස හා බහිරව රූප සටහන් කරමින් ඉතා චාම් අන්දමින් නිර්මිත බැව් හඳුනාගත හැක. මෙහි වන පුන්කලස් ද ඒ හා සමානය. ඒවාද ඉතා චාම් ආකාරයක් ගනී. එහි පවතිනුයේ පියුම් පෙති රූකම් පමණක්වන අතර එය ද ඉතා අල්ප වූ ආකාරයෙන් භාවිතකොට ඇති බැව් පැහැදිලිය. වටදාගෙය වටා ගල්වේලි වලද ඇත්තේ පියුම්පත් රටාවන් වේ. මේ ආකාරයෙන් ඉතාම චාම් මල්ලියකම් හා සත්ත්ව රූප රූකම් මෙම විහාරය ආශ්‍රිත නිර්මාණ අලංකරණයට යොදාගෙන ඇති ආකාරය විද්වතුන් විසින් පැහැදිලිකොට දෙයි. වටදාගෙය හා ඒ ආශ්‍රිත අනෙකුත් පුරාවිද්‍යා සාධක ආශ්‍රිතව දැකගත හැකි තවත් වැදගත් නිර්මාණයක් වශයෙන් සඳකඩපහණ දක්වමු. මෙම සඳකඩපහණ බොහෝ තැන්වල දක්නට ඇති අන්දමේ මල්කම් ලියකම් සත්ත්ව රූප ආදියෙන් නිර්මිතයන් නොවන අතර මෙය ඉතා චාම්, රූකම් නිර්මාණයන්ගෙන් තොර හිරිගල් භාවිතයෙන් හරි අඬ සඳ ආකෘතියෙන් නිර්මාණය කොට ඇති බව හඳුනාගත හැක. මුරගල් ද එසේමය. ලංකාවේ මුරගල්වල ඉතිහාසය ගත් කළ එහි පරිණාමීය අවස්ථා කිහිපයක් තුළ වූ නිර්මාණයන් අතුරින් මැදිරිගිරිය වටදාගෙය ආශ්‍රිතව දක්නට ඇති මුරගල් අයත් වනුයේ මෙහි මුල් විකාශන අවධියට යි. මෙම අවස්ථාව යටිකුරු පලිහ නමින් හඳුන්වනු ලබන අතර සරල රූකම් සහිත මෙන්ම රහිත වන වශයෙන් මුරගල් දැකගත හැක. මේ අයුරින් හඳුනාගන්නා මුරගල්වල රූකම් සහිත ඒවා ද දැඩි ලෙස හායනය වී ගොස් ඇති නිසාවෙන් ඇතැම් අවස්ථාවන් නිවැරදිව හඳුනාගැනීම ද ගැටලුකාරී තත්ත්වයක් ඇති කරයි. මේ අයුරින් එකම ස්ථානයකින් ආකාර කිහිපයක නිර්මාණ වාර්තා වීම තුළ මෙය එකම කාලයක නිර්මාණය වූවක් නොවන බවත් අවධි කිහිපයක නිර්මාණ මෙතුළ වන බවත් සක්සුදක් සේ පැහැදිලිවනු ඇත.

## සමාලෝචනය

ලක්දිව පුලතිසිපුර පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ මැදිරිගිරිය විහාර සංකීර්ණය ඉතාම සුවිශ්ෂී වූවකි. මෙසේ සුවිශේෂී යැයි දක්වන්නට කරුණු ඉහතින් සාකච්ඡා කොට ඇත. ආරෝග්‍ය ශාලාවන් පවා පවතින හෙයින්ම සියලු පහසුකම් සහිතව ඉදිකොට ඇති විහාර සංකීර්ණයන් පිළිබඳව මෙහි දී තොරතුරු වාර්තා කෙරෙන අතරම එමගින් සමකාලීන සමාජමය කාර්යයන් රැසක වගකීම් දරනු ලැබූවන් ලෙස අර්ථ දැක්වීම වඩාත් නිවැරදි වනු ඇත. මෙම ආරෝග්‍ය ශාලාව සම්භන්ධ නීති රීතීන් ද මැදිරිගිරිය විහාර අත්තානි ලිපිවල අන්තර්ගතව පැවතීම තුළ එය සනාථ කෙරේ. මෙම මැදිරිගිරිය වටදාගෙය අයත් විහාර සංකීර්ණය අක්කර ගණනක් පුරා පැතිර පවතින්නක් වුව ද මේ වන විට සංරක්ෂණ කටයුතු කොට ඇත්තේ ඉන් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් වේ. අතීතයේ රටේ රාජ්‍ය පාලකයින්ගේ මෙන්ම ප්‍රාදේශීය පාලකයින්ගේ ධනවතුන්නගේ ද අවධානය යොමු වූවක් වන මෙහි එදා පටන් ක්‍රිස්තු වර්ෂ 12වන සියවස දක්වාම භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කොට ඇති බව හඳුනාගත හැක. පොළොන්නරු යුගයේ අභාවය නිසාම විනාශයට පත් වූ මෙම විහාර සංකීර්ණය අතීතයේ දී භික්ෂූන්ට වඩා නිස්කලංක වඩාත් උපයෝගීවූත් ආරාම සංකීර්ණයක් වන්නට ඇතැයි අනුමාන කෙරේ. මේ ආකාරයට අත්හැර හුදෙකලා වූ පුරාවිද්‍යා භූමිය පසුකාලීනව නිධන් සොරුන්ගේ ග්‍රහණයට නතු වී ඇති බව වටදාගෙය ස්තූපය හාරා තිබීම මෙන්ම බුද්ධ හා බෝධිසත්ව ප්‍රතිමාවලට සිදුකොට ඇති හානිවලින් සනාථ වේ. අනතුරුව මෑතකාලීන ජනතා අවධානයට ලක් වූ මෙහි එළි පෙහෙළි කිරීම් කොට ඉතිරි පුරාවිද්‍යා ස්මාරකයන්ට ද නිවැරදි වටිනාකම් ලබාදෙමින් සංරක්ෂණ කටයුතු සිදුකොට ජනතාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම ජාතික වගකීමක් මෙන්ම යුතුකමක් ද වනු ඇත.

## ආශ්‍රිත මූලාශ්‍ර


- පරණවිතාන, සෙනරත්. (1972). පුරාවිද්‍යා පර්යේෂණ. බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ.
- බාලසූරිය, ජයසිංහ. (2001). වටදාගේ. පොළොන්නරුව, පැරකුම් ප්‍රකාශකයෝ.
- http://www.en.wikipedia.org/wiki/vatadage. [Access - 2023/06/12]